# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සත්ව (සංශෝධන)

**1958 අංක 29 දරන සත්ව පනත සංශෝධනය කිරීම සඳහා වූ**
**පනත් කෙටුම්පතකි**

---

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා විසින්
2026 ජූලි මස 21 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2026 ජූනි මස 11 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[69 වන පනත් කෙටුම්පත]**


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 14.50 තැපැල් ගාස්තුව: රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

**2 වන වගන්තිය** : මේ වගන්තිය මඟින් 1958 අංක 29 දරන සත්ව පනතේ 38 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ "සතකු" යන යෙදුමේ අර්ථ නිරූපණයට එළුවන්, ඌරන් සහ බැටළුවන් එකතු කිරීම මඟින් II වන කොටසේ විධිවිධාන එළුවන්, ඌරන් සහ බැටළුවන් සඳහා ද අදාළ කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

එල්.ඩී. - ඕ 71/2025

## 1958 අංක 29 දරන සත්ව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2026 අංක      දරන සත්ව (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1958 අංක 29 දරන පනතේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** 1958 අංක 29 දරන සත්ව පනතේ 38 වන වගන්තියේ “සතකු” යන යෙදුමේ අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ: -

"“සතකු” යන්නෙන් එළ හරකකු හෝ මී හරකකු අදහස් වන අතර එයට -

(අ) II වන කොටසෙහි දී එළුවකු, ඌරකු හෝ බැටළුවකු; සහ

(ආ) IV වන කොටසෙහි දී බැටළුවකු, එළුවකු, ඌරකු හෝ කුකුළු යන සතකු,

ඇතුළත් වේ;”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

PL 15852 - 342 (2026/07)